Page 4 July 2010.qxd 22/07/2010 21:58 Page 1





එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කි මුන් මහතා
UN Secretary General Mr Ban Ki Moon

1 වෙනි පිටුවෙන්.........

# මොනවද මේ වෙන්නෙ?

සමුළුව ද ඒ ආකාරයෙන්ම බැංකිගේ මේ කමිටු පත්කිරීම හෙළා දැක ඇත. සමහර අන්තර් ජාතික විමර්ෂකයින් දක්වන පරිදි මෙම අවස්ථාවේදී මහලේකම් බැන්කි මූන් කටයුතු කර ඇත්තේ වග කීමකින් තොරවය. ඔවුන් කියන්නේ මහලේකම්ගේ ප්‍රධාන වගකීම විය යුත්තේ එක්සත් ජාතීන් තුළ ඇති එහි එහි සංවිධාන හා සාමාජික රටවල් ආදි ආයතන වෙත බවය. එහෙත් ඔහු මෙතැනදී කටයුතු කර ඇත්තේ එන්ජිඕකාරයින් මානව හිමිකම්කාරයන් යයි තමන් විසින්ම හඳුන්වා ගන්නා ලද, තැන් තැන් වලින් අහුලාගත්, කාටවත් වගකීමකට බැඳී නැති සංවිධාන වෙනුවෙන්ය. මෙසේ එක්සත් ජාතීන්ගේ මහලේකම් වශයෙන් ඔහු තම ප්‍රධාන වගකීම පැහැර හැර ඇත.

## පිළිගත නොහැකි විමසුම් මාතෘකා

මේ කමිටුවට විමසුම සඳහා දෙනු ලැබූ කරුණු අතර එකක් වනුයේ යුද්ධය අවසන් කාලපරිච්ඡේදය තුළ දී කොටි සංවිධානයේ සටන්කරුවන් සහ ලංකා සන්නද්ධ හමුදාවන්හි සටන් කරුවන් විසින් උල්ලංඝනය කරනු ලැබ ඇති මානව හිමිකම් සොයා බලන ලෙස දක්වා ඇති කාර්‍යයයි. මෙතැනදී වගකීමකින් තොරව නිර්දය ලෙසම මිනිස් ඝාතන රැල්ලක්ම සිදු කළ මිනීමරු කොටි ත්‍රස්තවාදීන් රැළක් සහ පූර්ණ යුද පුහුණුව ලැබූ රටක හමුදා ඒකකයක් යටතේ සටන් කළ විනයගරුක යුද්ධ හමුදාවක් සහ එකම මට්ටමක දමා සැලකීමට පිළිගෙන තිබීමක් පෙනේ. මෙහිදී බැංකිමූන් නිග්‍රහකොට ඇත්තේ තමා මහලේකම් වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටකට සහ ඒ රටේ යුදහමුදාවටය. එසේම අපේ රටට සහ එහි ජනතාවටය. අප හැම මෙයට තදින් විරෝධය පළකළ යුතුය.

සිය ධුර කාලය අවසන් වීමට ළංව ඇති බැවින් බැංකිමූන් මෙසේ කටයුතු කරනුයේ මොන අභිප්‍රායකින්දැයි සිතේ. එය තවත් ධුර කාලය දික්කර ගැන්ම සඳහා බටහිර රටවල හොඳ හිත දිනාගැනීමටයයි සමහරු කියති. නමුත් අද වෙනස්ව ඇති ලෝකයක බටහිර රටවල් අභිප්‍රායන් ඉටුකර ගැනීමට උදව්වීමෙන් ඔහුට සිදුවන්නේ අවාසියක් මිස වාසියක් නොවන බව බැන් කි මූන් අවබෝධකර ගත යුතුය. ඔහු එපමණ මොඩයෙකු නොවේ. ඉතින් ඔහු මේ අදින්නේ මොකාටදැයි අප මුලදීම අසා ඇත්තේ එබැවිනි.

## නවක වධය හිස ඔසවයි

ශ්‍රීලංකාවේ විශ්වවිද්‍යාල තුළ වසංගතයක්ව පවතින නවක වධය යන හිංසාකාරී ක්‍රියාවලිය ගැන දිගින් දිගට විස්තර නොකළද එය කවුරුත් දනිති. එය කිසිම ශිෂ්ට සමාජයක් තුළ පිළිගත නොහැකි, පිළිකුලෙන් ප්‍රතික්ෂෙප කළ යුතු ක්‍රියාකලාපයකි. විශ්වවිද්‍යාල අධිකාරීන් විසින් මේවායේ යෙදෙන අයට තද දඬුවම් කිරීමට තර්ජනය කොට තිබුණද සෑම වසරකම නවකයින් එන කාලයට මේවා ද ආරම්භ වෙයි. කණගාටුවට කරුණ නම් මෙය විශ්වවිද්‍යාල වල සම්ප්‍රදායක් බවට පත්ව තිබීමයි.

මෙම නිහීන නවක වධය දුන් ශිෂ්‍යයාට විරුද්ධව පන්ති තහනම්කිරීම් ආදියෙන් දඬුවම් දුන් සෑම විටකම ශිෂ්‍යයින් එම දඬුවම් වලට එරෙහිව නැගී සිට පෙළපාලි ගොස් ඊට පසු පන්ති වර්ජනය කොට එම නවක වධයේ යෙදුණු අය බේරාගැනීම සිදුවිය. එහෙත් කෲර ලෙස හැසුරුණු ඔවුන් පන්ති තහනම් කළ විගස අහිංසකයින් වී හමාරය. දැන් ඒ අයට දඬුවම් කළ අධිකාරීන් දෙස බලන්නේ ශිෂ්‍යයින්ගෙන් කෲර ලෙස පළිගන්නට බලන අය ලෙස ය. නවක වධයට භාජනය වී මානසික කායික පීඩනයට ලක් වූ අහිංසක නවකයාට කාගේවත් පිහිටක් නැත. මෙවැනි කැත සම්ප්‍රදායක් ලෝකයේ වෙනත් කිසිම තැනක නොවේ.

මේවා පිටුපස ඉන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශපාලනයට අරක්ගෙන ඇති වාමාංශික දේශපාලන පක්ෂයක් බැව් කවුරුත් දනිති. මෙවැනි කළබල විශ්ව විද්‍යාලවල ඇති කළ පමණට සිය දේශපාලන ව්‍යාපාරය සඳහා නව සාමාජ-කයින් බඳවාගැනීමට හැකිවෙයි. මේවාට බැඳුණාට පසු එම ශිෂ්‍යයින් එම පක්ෂයේ බලාපොරොත්තු සඳහා යොදවා ගැනීම හැර ඔවුන් ලබන සෙතක් නැත. අව සානයේ ඔව්හු සිය ඉගෙනීම ද කඩාකප්පල් කර ගනිති. මෙම දේශපාලන පක්ෂ කාරයින්ට ශිෂ්‍යයින්ගේ දියුණුව ගැන තැකීමක් වගකීමක් නැත.

පසුගිය මහ මැතිවරණයෙන් පසු මේ දේශපාලන පක්ෂය අන්ත පරාජයක් ලැබීමෙන් පසු ඊයේ පෙරේදා නැවත නවකවධ පෙර හුරුවක් දකුණේ විශ්වවිද්‍යාලයේ ආරම්භ කළ බව ආරංචි විය. අධිකාරීහු එම නවක වධයේ යෙදුණු ශිෂ්‍යයාගේ පන්ති තහනම් කර දඬුවම් කළෝය. එයට එදිරිව සුපුරුදු පරිදි එම පීඨයේ සිසුහු පන්ති වර්ජනයක් ඇරඹූහ.

විශ්වවිද්‍යාල අධිකාරීන් වෙනස් නොකරන නොනැමෙන ස්ථාවරයෙන් කටයුතු කළ බැවින්ද, වර්ෂ අවසාන විභාග මේ දිනවල පවත්වන බැවින්ද, විශේෂයෙන් අවසාන විභාග හමාරකොට සමහරුන් ගෙදර යන්න සූදානමින් සිටි බැවින්ද, මේ සියළු සාධක නිසා වර්ජකයින් වර්ජනය නවතා පන්තිවලට ඒමෙන් වර්ජනය සිඳී ගියේය. නව රජයද උසස් අධ්‍යාපන ඇමතිවරයාද නවක වධයට විරුද්ධව තදින් කටයුතු කරන්නට අපේක්ෂාකරන බව ප්‍රකාශකොට ඇත. මෙම ප්‍රකාශයන් කළාට මදිය. ප්‍රකාශ ක්‍රියාවට නැගිය යුතුය. නව උසස් අධ්‍යාපන ඇමතිවරයා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ව්‍යාපාරවලින් එකල දේශපාලනය අරඹා ක්‍රියාකාරී ලෙස අත්දැකීම් ඇත්තෙකු බව දනිමු. මුලින් සඳහන් කළ පරිදි මේවා පිටුපස සිටින දේශපාලන පක්ෂය අන්ත පරාජයට පත්වී සිටින මේ අවධියේ ඊළඟ නවවසර අරඹන විට උපක්‍රමශීලී ලෙස ඒ අයට මුහුණු බැඳගෙන එන්නට කෙසේවත් ඉඩ නොදිය යුතුය. එමගින් මෙම නවකවධය නම් ව්‍යසනය නිර්දය ලෙස මුලිනුපුටා දැමිය යුතුය. ඉදිරියේදී මේ ගැන මෙයට වඩා දීර්ඝව ලියන්නට අදහස් කරමු.

## සංචාරක ව්‍යාපාරය මුවාවෙන් කරන සංස්කෘතික විනාශය

සංචාරකයින් ඒම වැඩිවීම සමගම සංචා රක ව්‍යාපාරයට රිංගාගෙන ඇති රජයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කණ්ඩායම් රටේ ස්වභාවය ගැන කිසිදු තැකීමක් නොමැතිව තම හිතුමතයට කටයුතුකරන බව පෙනෙන්නට තිබේ. මෑතක වූ සිදුවීමකින් මෙය පැහැදිලි කරමු.

සති කීපයකට පෙර සීගිරියේ සංස්කෘතික ආරක්ෂක සේවයේ යෙදෙන ඩබ්ලිව්. එම්. විජේරත්න නම් කම්කරු මහතා සහ තවත් සේවකයින් කළ චෝදනාවකින් මෙය හෙළිවිය.

සීගිරි ගලේ මැද හරියට නගින විට තිබෙන සිංහපාදය සහිත දොරටුවකි. ඔවුන් එතැනදී දුටුවේ එම ගල ඩ්‍රිල් කරමින් (විද්‍යුත් කූරකින් හිලක් විදිමින්) ගොඩ නැගිලි වගයක් ඉදිකිරීමේ කීප දෙනෙක් යෙදී සිටින ආකාරයයි. විමසා බැලූවිට පෙනුණේ ඔවුන් ඒ ලැස්තිවෙන්නේ එතැන කුඩා රෙස්ටුරන්ට් එකක් ඇටවීමට බවයි. මේ කාර්‍යයේ යෙදී සිටියේ පෞද්ගලික අංශයේ පිරිසකි. මේ සඳහා ඔවුන්ට අවසර දුන්නේ කවුරුදැයි නොපැහැදිලි විය. අර සීගිරි කම්කරුවෝ මෙයට විරෝධය පාමින් එතැන හිඳගෙන වර්ජණයක යෙදුනාහ. පසුව මේ සිද්ධිය ජනාධිපතිතුමාට සැල වූ විගස ඒ ඉදිකිරීමේ කටයුතු වහා නවත්වන්නට නියෝග කෙරිණ. එය තවම විභාග කෙරෙයි. පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජෙනරාල් පවා පැමිණිය විට පෙනී ගියේ දෙපාර්තමේන්තුවේ කවුරුවත් එවැන්නකට එවැනි අවසර දී නැති බවත්, පෞද්ගලික ව්‍යාපාරිකයන්ට හිතෙන ආකාරයට ඒ කටයුතු කෙරෙන බවත්ය. පුරා විද්‍යා අංශය භාර සංස්කෘතික ඇමතිනිය පවා මේවා ගැන නොදන්නීය.

සීගිරිය යනු අපේ ජාතික කෞතුක වස්තුවකි. එය ලොව අටවන පුදුමය ලෙසද සැලකේ. මේ හැර 1970 ගණන් වලදී සීගිරිය ලෝක මානව උරුමයේ සංස්කෘතික භූමියක් ලෙස යුනෙස්කෝව විසින් නම්කරනු ලැබ ඇති භූමියකි. එය සැලකෙන්නේ අපට ඇති අයිතියටත් වඩා මුළුමහත් මානුෂික උරුමයේ කොටසක් වශයෙනි. එවැනි තැන්වල ඩ්‍රිල්කරමින් කඩ සාප්පු හදනවා තබා ඇණයක් වත් ගැසීම තහනම්ය. මේ සිද්ධියෙන් පෙනෙනුයේ පුරා විද්‍යා අංශය භාර ඇමති අධ්‍යක්ෂක කෙරුමන්ලා වත් මේ කරුණු නොදන්නා බවයි. නැතිනම් ඒවා ගැන ඔවුන්ගේ තැකීමක් නැති බවයි. දැන් තේරෙන්නේ රටේ හැමදේම සංචාරකයින් පිනවීමට කරන බවකි. ඩොලර් හම්බකිරීමට අන් සියල්ල පසෙක ලා සංචාරක අධිකාරියට කටයුතු කළ හැකි බවකි. මෙවැනි සිද්ධීන් වාර්තා වූ පළමු වෙනි වතාව මෙය නොවේ. ශ්‍රීපාද ස්ථානය මුදුනේ සංචාරක හෝටලයක් තැනීමට කටයුතු දැනට යොදා ඇති බවද වාර්තාවිය.

සංචාරක ඇමතියෙකු සිටිනවාදැයි වත් හාංකවිසියක් නැත. විදේශ විනිමය ලැබෙනවා නම් රට, ජාතිය, ආගම, සංස්කෘතිය විකුණාගෙන කෑමට මොවුන් සූදානම්ය. දැන් දැන් බොහෝ සංචාරකයින් අප රටට එන්නේ මේ සංස්කෘතික දේවල්, පරිසරය, වන සංරක්ෂණය ආදිය අගය කරන බැවිනි. නැතිව මුහුදු වැල්ලේ හිපියන් මෙන් හික්කඩුවේ හෙළුවෙන් නටන්නට නොවේ. සංචාරක ව්‍යාපාරය කරවන වුන්ට මේ ගැන කිසිදු අවබෝධයක් නැති බවකි පෙනෙනුයේ. මේ තැන් අරක්ගෙන ඇති කුම්භාණ්ඩයින්ගෙන් මේවා බේරාගෙන සුද්ධකර ගත යුතු ය. මේ සංස්කෘතික දායාදයන් ආරක්ෂා කරගත යුතු ය.



මේ ඓතිහාසික සිංහගිරි හෙවත් සීගිරියට පිවිසෙන දොරටුවයි. ඒ දොරටුව සාදා ඇත්තේ සිංහයෙකුගේ මුඛය තුළින් පිවිසෙනවා වැනි හැඟීමක් දනවනු පිණිසය. ක්‍රි.ව. **477-495** දක්වා රජ කළ කාශ්‍යප රජතුමා විසින් සාදවන ලද මෙම විෂ්මය ජනක නිර්මාණය අප අතීත කලාකරුවන්ගේ අද්විතීය කලා මහිමය කියාපාන කැඩ පතකි. කවුදෝ කාලකණ්ණි පිරිසක් මේ ගල කඩා මේ ඇතුළත ආපන ශාලාවක් දමන්නට කොන්ත්‍රාත්තුවක් ගෙන ඇති බව එළි වී ඇත..



විශ්වවිද්‍යාලයට අළුතෙන් ආ ශිෂ්‍යයෙකුට නවක වධය දෙන පැරණි සිසුන් පිරිසක්

## හික්කඩුව නම් අපේ ගමට අඩුව තිබුණේ මෙපමණකි. දැන් එය ද සම්පූර්ණය!↓

## Hikka Beach Festival
## වැල්ලේ සැණකෙළිය







**මේ** සංචාරක ව්‍යාපාරය නංවා දිවයිනට සංචාරකයින් අද්දවා ගැන්ම පිණිසය කියා හික්කඩුවේ වැල්ල අසබඩ ගිය වසරේ ජූලි මාසයේ පැවැත්වුණු හික්කා 2009 නම් සැණකෙළියේ නටන විනෝද වෙන පිරිසකි. දැන් හැම වසරකම හික්කඩුවේ මෙය පවත්වන්නට තීරණය කර ඇත. පළාතේ වැසියන් කියන්නේ සංචාරක ව්‍යාපාරයේ දියුණුව කෙසේ වෙතත් මින් ලාංකික තරුණ පෙළ සදාචාරයෙන් අන්තිමටම පිරිහෙන බවයි. මත් බෙහෙත් හා සුරාවටද දුරාචාරයටද තරුණ පරම්පරාව කැඳවාගෙන යන ගමනක් ලෙස ශ්‍රීලංකාවේ බොහෝ දෙනාට මේ හික්කා නාඩගම පෙනෙන්ට පටන්ගෙන ඇත.